# <u>විශේෂ නිවේදනයයි</u>

**<u>2023.09.01 දිනැති අංක 2348 දරණ රජයේ ගැසට් පත්‍රයේ පලකරන ලද වයඹ පළාතේ, පළාත් සභා පාසල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 පන්තියේ I (අ) ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා දිස්ත්‍රික් පදනම මත උපාධිධාරීන් බඳවා ගැනීම යටතේ අනුමත පුරප්පාඩු අතුරින් තවදුරටත් ඉතිරි වී ඇති පුරප්පාඩු පිරවීම සඳහා වන සම්මුඛ පරීක්ෂණය 2024.04.16</u>**

2023.09.01 දිනැති අංක 2348 දරණ රජයේ ගැසට් පත්‍රයේ පලකරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 පන්තියේ I (අ) ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා දිස්ත්‍රික් පදනම මත උපාධිධාරීන් බඳවා ගැනීම සඳහා වූ විවෘත තරඟ විභාගයේ ප්‍රතිඵල මත අනුමත පුරප්පාඩු අතරින් තවදුරටත් ඉතිරි වී ඇති පුරප්පාඩු පිරවීම සඳහා සුදුස්සන් තෝරාගැනීමේ සම්මුඛ පරීක්ෂණය 2024.04.16 වන දින වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී පැවැත්වීමට සැලසුම් කර ඇත.

02. ඒ අනුව, පහත නාම ලේඛනයේ නම් සඳහන් අයදුම්කරුවන් පහත සඳහන් ලේඛන වල සහතික කරන ලද පිටපත් කට්ටල දෙකක් සමග 2024.04.16 දින පෙ.ව. 9.30 ට වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පැමිණෙන මෙන් කාරුණිකව දන්වමි. එසේ පැමිණීමේ දී මේ සමඟ පළ කර ඇති ප්‍රකාශ පත්‍රයද සම්පූර්ණ කරගෙන ආ යුතුය.

**මේ වන විටත් කැඳවීම් ලිපි තැපැල් කර ඇති අතර, ලිපි නොලැබුණ ද ලේඛනයේ නම සඳහන් වී ඇත්නම් සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලබා ඇති බැවින් එදිනට පැමිණෙන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.**

I. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.
II. උප්පැන්න සහතිකය.
III. අ.පො.ස. (සා.පෙ.) සහතිකය.
IV. අ.පො.ස. (උ.පෙ.) සහතිකය.
V. උපාධි සහතිකය.
VI. වලංගු දිනය හා විෂයයන් ඇතුළත් විස්තරාත්මක උපාධි සහතිකය. **(පන්ති සාමාර්ථය සඳහා ලකුණු ලබාදෙන බැවින් මෙම සහතිකය පසුව ඉදිරිපත් කිරීමට අවසර දෙනු නොලැබේ.)**
VII. පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරි විසින් DS4 ආකෘතියෙන් නිකුත් කරනු ලබන ග්‍රාම නිලධාරි සහතිකය. (අයදුම්කරු වයඹ පළාත තුළ පූර්වාසන්න වසර තුනක ස්ථිර පදිංචිය සනාථ කළ යුතු අතර ග්‍රාම නිලධාරි සහතිකයෙන් වසර තුනක පදිංචිය තහවුරු නොවන අවස්ථාවල දී කලත්‍රයා වයඹ පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු නම් කලත්‍රයාගේ පදංචි සහතිකය සමග විවාහ සහතිකය හෝ අයදුම්කරු වයඹ පළාතේ ම වෙනත් ග්‍රාම නිලධාරී වසමක පදිංචිව සිටියේ නම් පෙර පදිංචිය හැරයාම පිළිබඳ අදාල ග්‍රාම නිලධාරී විසින් ලබා දෙන ලිපියක් මගින් හෝ වයඹ පළාත තුළ පූර්වාසන්න වසර තුනක ස්ථිර පදිංචිය සනාථ කළ හැකිය)
VIII. උප්පැන්න සහතිකය, හැඳුනුම්පත හෝ අධ්‍යාපන සහතිකවල සඳහන් නම් අතර කිසියම් වෙනසක් ඇත්නම් ඒ බව සනාථ කිරීම සඳහා දිවුරුම් ප්‍රකාශය.

03. ගැසට් නිවේදනයේ 8.4 (ආ) ඡේදයේ සඳහන් පරිදි මෙම සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් සහතිකවලට ලකුණු ලබාදීමට නියමිත හෙයින් එම සහතික වල මුල් පිටපත් සහ ඔබ විසින් සහතික කළ <u>ඡායා පිටපත් කට්ටල දෙකක්</u> බැගින්ද රැගෙන ආ යුතුය. <u>මෙම සහතික වෙනත් දිනකදී ඉදිරිපත් කිරීමට ඉඩ දෙනු නොලැබේ.</u>

I. දහම් පාසල් අවසාන විභාග සහතිකය හෝ වෙනත් ආගම් සඳහා ඒ හා සමාන මට්ටමේ විභාගයක් සමත් වී ඇති බවට පිළිගත් සහතිකයක්.
II. ක්‍රීඩා, සෞන්දර්ය ආදී විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා රජයේ හෝ රජය පිළිගත් ජාතික මට්ටමේ ප්‍රථම, දෙවන, තෙවන ජයග්‍රහණ ලබාගත් සහතික.

**සටහන -**
**ඉහත සඳහන් සහතික හැර වෙනත් සහතික සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ.**

04. ඔබ මෙම සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත්වීම, ප්‍රායෝගික පරීක්ෂණයට ඉදිරිපත්වීමට හෝ පත්වීමක් ලැබීමට අනිවාර්ය හිමිකමක් නොවන බව සැලකිය යුතුය.

**ඊ.එම්.පී. ඒකනායක,**
**ලේකම්,**
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.